ගලිගමුව ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

2015 වර්ෂයේ ගිණුම් විගණනයේදී නිරීක්ෂණය කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුණු අක්කර 13 පර්චස් 95 කින් යුත් ඉඩම් කොටස් 15 ක හා භූමි ප්‍රමාණය සඳහන් නොවූ ඉඩම් කොටස් 05 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.18,993,404 ක් වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.5,919,442 වූයෙන් වෙනස රු.13,073,962 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ අයවිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව පිළිවෙලින් රු.19,766,122 ක් හා රු.12,603,754 ක් විය.

1.3.4 නීති, රීති,රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත 158(1) වගන්තිය | දීර්ඝ කාලයක සිට අය නොවී පැවතිය ද සභාව විසින් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණු 2016 දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු හා අක්කර බදු එකතුව රු.592,863 ක් විය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවූ රු.8,043 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,995,783 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,954,918 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,040,865 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,040,865 ක වර්ධනයට ආදායම් විෂයයන් 06 ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | 2016.12.31 දිනට හිඟය | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනටහිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2016.01.01 දිනට පැවති හිඟයෙන්හිඟ | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
| | රු 000. | රු 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i )වරිපනම් හා බදු | 673 | 440 | 2,429 | 1,329 | 237 | 381 | 618 |
| (ii)බදුකුලී | 4 | 4 | 259 | 259 | - | - | - |
| (iii)බලපත්‍ර ගාස්තු | - | - | 459 | 459 | - | - | - |
| (iv)වෙනත් ආදායම් | 4 | 4 | 64 | 64 | - | - | - |
| එකතුව | 681 | 448 | 3,211 | 2,111 | 237 | 381 | 618 |

2.3.2 බලපත්‍ර ආදායම්

---------------------

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1533 / 16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගතයුතු නියමිත කටයුත්තක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු වුවත් 2016 නොවැම්බර් 03 දින වනවිටත් සභා බල ප්‍රදේශය තුල ව්‍යාපාර ආයතන 46 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොටියාකුඹුර ගව මස් කඩය 2014 වර්ෂයට ටෙන්ඩර් කිරීමට අදාලව හිග බදු මුදල් අයකර ගැනීම සඳහා කෑගල්ල දිසා අධිකරණයේ පවරන ලද නඩුවේ 2016 මැයි 06 දිනැති තීන්දුවට අනුව රු.525,146 ක හිග මුදල අයකර ගැනීම සඳහා නියෝග කර තිබූ නමුත් එම මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) වරිපනම් බදු දේපල වසර 05 කට වරක් තක්සේරු කළයුතු වුවද 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි.

(ඇ) භෞතික විගණන පරීක්ෂාව සිදු කළ 2016 නොවැම්බර් මස වන විට සභාව සතු වාහන 02 ක රක්ෂණ සහතික වල වලංගු කාලය මාස 01 හා 04 කින් සහ වාහන 04 ක ආදායම් බලපත්‍ර වල වලංගු කාලය මාස 01 හා 03 කින් ඉකුත් වී තිබුණි.

(ඈ) 1999 වර්ෂයේදී සිල්වටෙරස් ඉඩම කට්ටි කිරීම මත ප්‍රාදේශීය සභාවට පොදු කටයුතු සඳහා ලබාදුන් ලොට් අංක 30 ඉඩම වටා ආරක්ෂක වැටක් ඉදිකර නොතිබුණ අතර යාබද ඉඩම් වල පදිංචිකරුවන් විසින් සභා ඉඩම අයත්වන පරිදි තාප්ප ඉදිකර තිබුණි.

3.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

සභාවට අයත් බැංකු ගිණුමක රු.46,582 ක මුදල් ශේෂයක් 2013 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රු.2,814,010 ක වියදමක් දරා තිබුණද 2017 මැයි වන විටත් කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කර නොතිබුණු අතර කැලි කසල වල දැමීමට කටයුතු කර තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බැවින් ගලි බවුසරය සේවයේ නොයොදන බව නිරීක්ෂණය වූයෙන් මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් සොයාගත නොහැකි සේවාදායකයන්ට ගලි සේවාව ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසාගෙන තිබුණ වැය විෂයයන් 27 ක එකතුව වූ රු.4,896,500 ක ප්‍රතිපාදන සියයට 100ක්ද විෂයයන් 15 ක ප්‍රතිපාදන වල සියයට 50 කට වැඩි ඉතිරිය රු.3,089,209 ක් ලෙස එකතුව රු.7,985,709 ක් සභා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5 (7) රීතිය ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යාම නිසිබලධරයාගේ කාර්යයක් වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | වත්කම් පාලනය | (i) ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම |
| | | (ii) අක්‍රීය බැංකු ගිණුම් ශේෂයක් පවත්වාගෙන යාම |
| (ආ) | අභ්‍යන්තර පාලනය | ප්‍රමාණවත් විගණනයක් සිදු නොකිරීම |
| (ඇ) | ණයගැති/ ණයහිමි පාලනය | අධි / ඌන වෙන්කිරීම් අවම වන ආකාරයට කටයුතු නොකිරීම |
| (ඈ) | ආදායම් පරිපාලනය | හිග වරිපනම් බදු අයකිරීමට නීත්‍යානුකූලව කටයුතු නොකිරීම |